**04-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබව වඩාත්ම ශ්‍රේෂ්ඨත්වයට පත් කරවීම පිණිස, පරමාත්ම දෙවියන්ම ඔබට ශ්‍රේෂ්ඨ උපදෙස් ලබා දෙයි, එය තුළින් ඔබ අපායේ වැසියන්ගෙන් දෙව්ලොව වැසියන් බවට පරිවර්ථනය වෙයි.

**ප්‍රශ්නය:** දේවතාවන් වීමට යන දරුවන්, වඩාත්ම සැළකිල්ලක් දැක්විය යුතතේ කුමන කාරණාවන්ටද?

**පිළිතුර:** කිසිම දෙයකට මුහුණ නරක් කර නොගන්න; ඔබගේ මුහුණ මළමිනියක් මෙන් නොකර ගන්න. කිසිම කෙනෙකුට දුකක් නොදෙන්න. දේවතාවන් වීම සඳහා, ඔබගේ මුවින් නිරන්තරයෙන් පිටවිය යුත්තේ මල් පමණයි. කටු හෝ ගල් මතු වන්නේ නම්, ඔබ නිකම්ම ගලක් මෙන් රැඳී සිටියි. ඉතා හොඳින් ගුණධර්ම ධාරණය කරගන්න. ඔබ මෙහිදී සියලුම ගුණධර්ම වලින් පිරි සිටිය යුතුයි. ඔබට දඬුවම් විඳින්නට සිදුවන්නේ නම්, ඔබට හොඳ තත්ත්වයක් නොලැබෙයි.

ඕම් ශාන්ති. නව ලෝකයේ අධිපතියන් වීමට යන ඔය ආධ්‍යාත්මික දරුවන්ට, ආධ්‍යාත්මික පියා, මෙතැන අසුන්ගෙන විස්තර කරයි. පරම පියා ඔබට ඔබගේ අසීමිත උරුමය ලබා දීමට දැන් පැමිණ ඇති බව, ඔය දරුවන්ට වැටහෙයි. අප වටිනා අය නොවීය. ඔවුන් පවසන්නේ අහෝ ප්‍රභූ මා නොවටිනා කෙනෙක්! මාව වටිනා කෙනෙක් බවට පත් කරවන්න! පරම පියා පවසන්නේ ඔය දරුවන්, මනුෂ්‍යයින්ය, දේවතාවන්ද මනුෂ්‍යයින් වන නමුත්, ඔවුන්ට දිව්‍යමය ගුණධර්ම තිබෙනවා. ඔවුන්ට සැබෑ මනුෂ්‍යයින් යැයි කියයි. මනුෂ්‍යයින්ට දැන් රකුසු ගති තිබෙන බැවින් ඔවුන්ට අමනුෂ්‍යයින් යැයි කියයි. ඔවුන්ගේ ක්‍රියාකාරකම් තිරිසනුන්ගේ මෙනි. කෙනෙකුට දිව්‍යමය ගුණදම් නොමැති විට, ඔහුට රකුසු ගති තිබේ යැයි කියයි. පරම පියා පැමිණ, ඔබව ශ්‍රේෂ්ඨ දේවතාවන් බවට පත් කරවයි. ලක්ෂ්මි සහ නාරායන් සැබෑ මනුෂ්‍යයින් වන අතර, ඔවුන් වාසය කරන්නේ සත්‍ය දේශයේය. ඔවුන්ට දේවතාවන් යැයි කියයි ඔවුන්ට දිව්‍යමය ගුණධර්ම ඇත. මිනිසුන්, 'අහෝ පාරිශුද්ධකරුවාණෙනි පැමිණෙන්න' කියා කීවත්, එම රජවරුන් පිවිතුරු වන අන්දමේ රහස සහ ඔවුන් අපවිත්‍ර රජවරුන් වන්නේ කෙසේද කියා නොදනී. එය භක්ති මාර්ගයයි. පරම පියා ඔය දරුවන්ට විස්තර කර දී, ඔබව ඔවුන් මෙන් පත් කරවයි (ලක්ෂ්මි සහ නාරායන්). ස්වර්ණමය යුගයේද දේවතාවන් ක්‍රියා සිදුකරන නමුත්, ඔවුන් අපවිත්‍ර ක්‍රියා සිදුකරන්නේ නැත ඔවුන්ට දිව්‍යමය ගුණධර්ම තිබේ. අපිරිසිඳු ක්‍රියා සිදු නොකරන්නේ දිව්‍ය ලෝකයේ වැසියන් පමණයි. මායා, අපායේ වැසියන් ලවා අපිරිසිඳු ක්‍රියා සිදුකරවයි. පරමාත්ම දෙවියන් දැන් මෙතැන අසුන් ගෙන, ඔබට කිසිදු අපිරිසිඳු ක්‍රියාවක් නොකරන ලෙසට උපදෙස් ලබා දීමෙන්, ඔබ ලවා ශ්‍රේෂ්ඨ ක්‍රියා සිදුකරවයි. ඔබව වඩාත්ම ශ්‍රේෂ්ඨ අය බවට පත් කිරීම උදෙසා, ඔහු ඔබට වඩාත්ම ශ්‍රේෂ්ඨ උපදෙස් ලබා දෙයි. වඩාත් ශ්‍රේෂ්ඨතම වන්නේ දේවතාවන් නොවේද? ඔවුන් වාසය කරන්නේ නව ලෝකයේය. ඔබ දරණ උත්සාහයට අනුව ඔබද මෙය වටහාගන්නේ, අංක පිළිවෙලටයි. මේ නිසයි, නිර්මාණය කරන මාලාව, අටක්, 108 ක් සහ 16,108 ක් වන්නේ, නමුත් කෙසේවෙතත්, එය කොපමණක්ද? මනුෂ්‍යයින් බිලියන ගණනක් සිටිනවා. එබැවින් ඔවුන්ගෙන් 16,000 ක් මතු වන්නේ නම්, එය කොපමණක්ද? එය සියයට එකකින් කාලක්වත් නොවෙයි. පරම පියා දරුවන්ව බොහෝ ශ්‍රේෂ්ට කරවයි. ඔහු සැම දිනකම ඔය දරුවන්ට විස්තර කරයි කිසිම පාපකාරී ක්‍රියාවක් සිදුකරන්න එපා. ඔබට එවන් පියෙක් හමුවී ඇත. එබැවින් ඔබ බොහෝ සතුට අත්විඳිය යුතුයි. අසීමිත පියා ඔබව දරුකමට හදාගෙන ඇති බව ඔබට වැටහෙනවා. අපි දැන් අයත් වන්නේ ඔහුටයි. පරම පියා, දිව්‍ය ලෝකයේ නිර්මාණකරුයි. එබැවින් එවන් දෙව්ලොවක අධිපතියන් වීම සඳහා, ඔබ සුදුසු විය යුතු මෙන්ම සියලුම ගුණධර්ම වලින් පිරී සිටියි යුතුයි. ලක්ෂ්මි සහ නාරායන් සියලුම ගුණදම් වලින් පිරී සිටියා. ඔවුන්ගේ වටිනාකම ප්‍රශංසාවට ලක්වෙනවා. උපත් 84 ක් ගැනීමෙන් පසු, ඔවුන් දැන් වටිනාකමක් නැති අය බවට පත් වී සිටියි. ඔවුන් පහළට බසින විට, එක් උපතකදී වුවත් ඔවුන්ගේ අංශක අඩුවෙයි. මේ අන්දමින් එය ක්‍රම-ක්‍රමයෙන් අඛණ්ඩව අඩුවෙයි. නාටකය උකුණෙක් මෙන් ඇදෙන අන්දමින්, ඔබත් ක්‍රම-ක්‍රමයෙන් පහළට බසියි. වසර 1250 කට පසුව, අංශක දෙකක් අඩුවෙයි. ඉන්පසුව රාවණාගේ රාජධානියේදී, අංශක අඛණ්ඩව වේගයෙන් අඩුවෙයි. සූර්යග්‍රහණ සහ චන්ද්‍රග්‍රහණ ඇති වන සේ, ජීවාත්මයන්ටද ග්‍රහණ ඇතිවෙයි. චන්ද්‍රයා සහ තාරකාවන්ට ග්‍රහණ ඇති නොවෙනවා නොවෙයි සැම කෙනෙක්ම සම්පූර්ණයෙන්ම ග්‍රහණයට ලක් වෙයි. පරම පියා පවසන්නේ

සිහිපත් කිරීම තිබීමෙන් පමණයි, ඔබගේ ග්‍රහණය පසු වී යන්නේ. කිසිම පාප ක්‍රියා සිදු නොකරන්න. අංක එකේ පාපය වන්නේ ශරීර අවධානයයි. මෙය ඉතාමත්ම බරපතල පාපයකි. පැරණි ලෝකය දැන් පරිවර්ථනය විය යුතු නිසා, ඔබට මෙම එක් උපතේදී පමණයි, ඉගැන්වීම් ලැබෙන්නේ. ඔබට මෙවන් ඉගැන්වීම් නැවත නොලැබෙයි. ඔබට උපතින් උපතට නීතිඥයෙකු වීමට ඉගැන්වීම් ලැබී තිබේ. එම පාසැල් ආදිය සෑම කල්හිම පවතින නමුත්, ඔබට මෙම ඥානය ලැබෙන්නේ එක් වරක් පමණයි. පරම පියා, ඥානයේ මහා සයුර පැමිණෙන්නේ එක් වරක් පමණයි. ඔහු තමන් ගැන සහ ඔහුගේ නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ මුළු ඥානයම ඔබට ලබා දෙයි. පරම පියා සෑම දෙයක්ම ඉතාමත්ම පහසුවෙන් විස්තර කරයි. ඔය ජීවාත්ම නළුවන්ය. ජීවාත්ම, ඔවුන්ගේ චරිත කොටස් රඟ පෑමට, ඔවුන්ගේ නිවසේ සිට මෙහි පැමිණෙයි. එයට විමුක්ති දේශය යැයි කියයි. දෙව්ලොව, ජීවන-මුක්තියේ දේශයයි. මෙහි ඇත්තේ ජීවන බන්දනයයි. මෙම වදන් නිවැරදිව සිහියේ තබා ගත යුතුයි. කිසිදු විටෙක සදාකාලික විමුක්තිය තිබිය නොහැක. මනුෂ්‍යයින්, සදාතනික විමුක්තිය අයදියි, එනම්, පැමිණීමේ සහ පිටව යෑමේ චක්‍රයෙන් පිටතට පැමිණෙන්ට ඔවුන්ට අවශ්‍යයි. කෙසේවෙතත්, කිසිම කෙනෙක් නාටකයේ ඔහුගේ චරිත කොටස රඟපෑමෙන් ඉවත් කළ නොහැක. මෙය, ආදි, සනාතන, කල් තියා නියම වූ නාටකයයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය ඒ අන්දමින්ම නැවත සිදුවෙයි. එම දේවතාවන්ම ස්වර්ණමය යුගයට ඇතුළු වෙයි. එවිට පසුව, ඉස්ලාම් අය සහ බෞද්ධයින් ආදිය පැමිණෙයි. මෙය මනුෂ්‍ය වෘක්ෂය බවට පත්වෙයි. මෙම වෘක්ෂයේ බීජය තිබෙන්නේ උඩ ඉහළය. මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය, පරම පියාය. මනුෂ්‍ය ජනගහණය සෑම කල්හිම පවතින නමුත්, ස්වර්ණමය යුගයේ එය ඉතාමත්ම අඩුය. ඉන්පසුව එය අඛණ්ඩව ක්‍රම-ක්‍රමයෙන් විශාල ලෙසින් වර්ධනය වෙයි. හොඳයි, එය නැවතත් අඩු වන්නේ කෙසේද? පරම පියා පැමිණ, අපවිත්‍ර අයව පිවිතුරු කරවයි. පිවිතුරු වන්නේ ඉතාමත්ම ටික දෙනෙකි. කෝටි ප්‍රකෝටියකින් මතු වන්නේ අතලොස්සක් පමණයි. චක්‍රයෙන් භාගයකම සිටින්නේ ඉතාමත්ම කුඩා පිරිසකි. ඉන්පසුව චක්‍රයේ ඉතිරි භාගයේදී විශාල වශයෙන් වර්ධනය සිදුවෙයි. ආරම්භයේදී පැමිණෙන්නේ දේවතා සමාජය බැවින්, වැඩිම ජනගහණයක් සිටිය යුත්තේ ඔවුන්ගෙනි. කෙසේවෙතත්, ඔවුන් පරම පියාව අමතක කළ නිසා, ඔවුන් වෙනත් ආගම් වලට ගියේය. මෙය එක් වැරැද්දක් පිළිබඳ නාටකයකි. ඔවුන් දුගී බවට පත් වුණේ, ඔහුව අමතක කිරීමෙනි. ඔවුන්ට ටිකින් ටික අමතක වූ අතර, දැන් සම්පූර්ණයෙන්ම අමතකව ගොසින්. වන්දනාවද මුලදි සිදුවන්නේ එක් අයෙකුට පමණයි, මන්ද, සියල්ලන්ටම විමුක්තිය ලබා දෙන්නේ ඒකායන ඔහු පමණයි. වෙනත් කෙනෙකුට වන්දනා කරන්නේ කුමකටද? ඔවුන්ව ලක්ෂ්මි සහ නාරායන් බවට පත් කළේ, ශිවාය. ඔවුන්ව එය බවට පත් කරන්නේ ක්‍රිෂ්ණා වන්නේ කෙසේද? එය සිදු විය නොහැක්කක්. ඔබට රාජයෝගාව උගන්වන කෙනා, ක්‍රිෂ්ණා වන්නේ කෙසේද? ඔහු ස්වර්ණමය යුගයේ රාජකුමාරයෙක්. මිනිසුන් මෙතරම් විශාල වරදක් සිදුකර තිබේ! ඔවුන්ගේ බුද්ධියේ මෙය පතිත වන්නේ නැහැ. පරම පියා පවසන්නේ දැන් මා සිහිපත් කර, දිව්‍යමය ගුණදම් ධාරණය කරගන්න. දේපළ නිසා යම් ආරවුලක් තිබෙන්නේ නම්, එය අවසන් කර දමන්න. එසේ නැත්නම් ඔබ තවමත් දබර කරගනිමින් සිටින අතර, ඔබගේ සිරුර අත්හරිනු ඇත. පරම පියා පවසන්නේ මෙම කෙනා සෑම දෙයක්ම අතහැරියේය. ඔහු කිසි කෙනෙක් සමඟ ආරවුලක් ඇති කරගත්තේ නැත. ඔබට ලැබෙන්නේ ඉතාමත්ම සුළු කොටසක් පමණක් වුවද, එය අත්හරින්න. ඒ වෙනුවට ඔබට කෙබඳු රාජධානියක් ලැබෙනවාද! ඔහුට විනාශයේ සහ රාජධානියේ දර්ශන ලැබුණු විට, ඔහු කෙබඳු සතුටක් අත්වින්දේද කියා, බාබා පවසයි. 'මට ලැබෙන්නට යන ලෝක රාජධානිය හා සසඳන විට, මේ සියල්ල කුමක්ද?' කිසි කෙනෙක් සාගතේ මිය නොයනු ඇත. කිසි මුදලක් නොමැති අයට පවා ඔවුන්ගේ කුස පුරවා ගැනීමට හැකිව තිබේ. මම්මා කිසිවක් රැගෙන ආවාද? මම්මාව බොහෝ සිහිපත් කෙරෙයි. පරම පියා පවසන්නේ ඇය සිහිපත් කළාට කම් නැත, නමුත් දැන් ඇගේ නම හෝ රූපය සිහි නොකරන්න. අපටත් ඇයට තිබූ ගුණදම් තිබිය යුතුයි. අප ද මම්මා මෙන් හොඳ වී, සිහසුනට වටිනා අය විය යුතුයි. ඇයට ප්‍රශංසා කිරීමෙන් පමණක් මෙය සිදුවන්නේ නැත. පරම පියා පවසන්නේ නිරන්තරයෙන් මා සිහි කරන්න. සිහිපත් කිරීමේ වන්දනාවේ සිටින්න. මම්මා කළ අන්දමින්ම ඥානය අන් අයට කියා දෙන්න. ඔබත් එවන් ප්‍රශංසාවන්ට සුදුසු වූ විට පමණයි, මම්මාගේ ප්‍රශංසාව ඔප්පු කිරීමට හැකි වන්නේ. නිකම්ම 'මම්මා, මම්මා' කියා කීමෙන් ඔබගේ කුස පිරනේනේ නැත. (ඔබ තෘප්තිමත් වන්නේ නැත.) ඔබගේ කුස සහ පිට, එකතු වෙයි. ඔබගේ කුස පිරෙන්නේ ශිව බාබා සිහිපත් කිරීමෙන් පමණයි. මෙම දාදා සිහිපත් කිරීමෙන්වත් ඔබගේ කුස පිරෙන්නේ නැත. ඒකායන කෙනා පමණක් සිහි කරන්න. ශ්‍රේෂ්ඨත්වය ඔහුගේ පමණයි. සේවය කිරීමට ක්‍රමවේද නිර්මාණය කළ යුතුයි. ඔබගේ මුවින් සෑම විටෙකම පිටවිය යුතතේ මල් පමණයි. කටු හෝ ගල් පිටවන්නේ නම්, ඔබ නිකම්ම ගල් මෙන් රැඳී සිටියි. ඉතාමත්ම හොඳින් ගුණදම් ධාරණය කරගන්න. මෙහිදී සියලුම ගුණදම් වලින් පිරෙන්න. ඔබට දඬුවම් විඳින්නට සිදුවන්නේ නම්, ඔබට

හොඳ තත්ත්වයක් නොලැබෙනු ඇත. ඔය දරුවන් මෙහි පැමිණෙන්නේ පරම පියාට ඍජුවම සවන් දීමටයි. මෙහි, බාබා ඔබට නැවුම් කුල්මත් බව ලබා දෙයි. ඔබ මධ්‍යස්ථාන වලදී කුල්මත් වෙයි. ඉන්පසුව ඔබ නිවෙස් වලට ගොස් ඔබගේ නෑදෑයින් දුටු විට, සියල්ල අවසන් වෙයි. මෙහි, ඔබ අසුන්ගෙන සිටින්නේ බාබාගේ පවුලේ අය සමඟ බව ඔබට වැටහෙයි. එහි තිබෙන්නේ අපවිත්‍ර පවුලකි. බොහෝ සණ්ඩු සරුවල් ආදිය සිදුවෙයි. ඔබ ආපසු ගිය ගමන්ම, කුණු ගොඩට වැටෙයි. මෙහිදී, ඔබ පරම පියාව අමතක නොකළ යුතුයි. ලෝකයේ කිසිම කෙනෙකුට සැබෑ සාමය ලබා ගැනීමට නොහැක. පරම පියා හැර කිසිම කෙනෙකුට පාරිශුද්ධත්වය, සතුට, සාමය සහ සමෘද්ධිය ලබා දිය නොහැක. පරම පියා මෙම ආශිර්වාදය ලබා දෙනවා නොවෙයි ඔබට දීර්ඝායු ලබේවා! ඔබට බොහෝ දූදරුවන් සිටිත්වා! නැත. ඔබට ආශිර්වාද ආදිය ලැබීමෙන් ඔබට කිසි යහපතක් සිදුවන්නේ නැත. එය මනුෂ්‍යයින් විසින් සිදු කරන ලද වැරදීමකි. සන්‍යාසීන්ටවත් ආශිර්වාද ලබා දිය නොහැක. අද ඔවුන් ඔබට ආශිර්වාද කරන මුත් හෙට ඔවුන්මද මියැදෙයි! බලන්න පාප්වහන්සේලා කීදෙනෙක් ඉඳ, නැතිවී ගොස් තිබෙනවාද කියා. ගුරුන්ගේ සිහසුන්ද තිබේ. ගුරු කෙනෙක් තරුණ වියේ මිය යන්නේ නම්, වෙනත් කෙනෙක් ගුරු කෙනෙක් බවට පත් කරනු ලබයි, එසේ නැත්නම්, තරුණ අනුගාමිකයෙක්ව ගුරු බවට පත් කෙරෙයි. මෙම බාප්දාදා, පිරිනමන්නාය. ඔහුට දෙන දේකින් ඔහු කුමක් කරන්නද? පරම පියා අශාරීරිකයි නොවේද? ගනු ලබන්නේ, ශාරීරික අයයි. මෙයත් වටහාගත යුතු දෙයකි. ඔබ ශිව බාබාට යමක් දුන් බව, කිසිම විටෙක නොකියන්න. නැත, අප ශිව බාබාගෙන් කෝටි ප්‍රකෝටියක් ගන්නා නමුත්, අප කිසි දෙයක් නොදෙන්නේය. බාබා ඔබට ලබා දෙන දේවල් ගණන් කළ නොහැක. ශිව බාබා, පිරිනමන්නාය ඔබ ඔහුට දෙන්නේ කෙසේද? ඔබ, 'මා මේ දේ දුන්නා' කියා සිතන විට, ශරීර අවධානය පැමිණෙයි. අප ශිව බාබාගෙන් ගන්නවා. මෙහි නැවතීමට පැමිණෙන දරුවන් බොහෝ දෙනෙක් බාබාට සිටිනවා, එබැවින් ඔවුන්ට පහසුකම් අවශ්‍යයි. එනම්, ඔබ ලබා දන්නේ ඔබටමයි. ඔහුට තමා වෙනුවෙන් කිසි දෙයක් කිරීමට අවශ්‍ය වන්නේ නැත. ඔහු ඔබට රාජධානිය ලබා දෙයි. ඔබ සෑම දෙයක්ම කරන්නේ ඒ නිසාය. ඔහු ඔබව, ඔහුටත් වඩා ඉහළ කෙනෙක් බවට පත් කරවයි, නමුත් ඔබ එවන් පියෙක්වත් අමතක කරයි! චක්‍රයෙන් භාගයකට ඔබ පිදුම් ලබන්නට සුදුසු වන අතර, චක්‍රයෙන් භාගයක් ඔබ පුදන්නන් වෙයි. පිදුම් ලබන්නට සුදුසු අය වීමෙන්, ඔබ සතුටු දේශයේ අධිපතියන් බවට පත් වෙයි. ඉන්පසුව ඔබ පුදන්නන් බවට පත් වීමෙන්, ඔබ දුක් දේශයේ අධිපතියන් වෙයි. පරම පියා පැමිණ දෙව්ලොව ස්ථාපිත කරන්නේ කවදාද කියා කිසිවෙකු නොදනී. මෙම දේවල් දන්නේ සංගම යුගයේ බ්‍රහ්මණයන් වන ඔබ පමණයි. බාබා සෑම දෙයක්ම ඉතාමත් හොඳින් විස්තර කර දෙන නමුත් එය ඔබගේ බුද්ධියේ තැන්පත් නොවෙයි. බාබා විස්තර කරන අයුරින්ම ඔබ මෙය උපායශීලීව විස්තර කළ යුතුයි. උත්සාහ දරා ඔවුන් මෙන්ම උසස් වන්න. ඔබ දිව්‍යමය ගුණධර්මද ධාරණය කළ යුතු බව, පරම පියා ඔය දරුවන්ට විස්තර කර දෙයි. කිසිම විටෙක කිසිම දේකට මුහුණ නරක් කර නොගන්න. ඔබගේ මුහුණ, මළමිනියක් මෙන් කර නොගන්න. පරම පියා පවසන්නේ දැන් එවන් ක්‍රියා සිදුනොකරන්න. චන්දිකා දෙවඟනට මේලාවක් තිබේ (ආදාහන දෙවඟන). පරම පියාගේ උපදෙස් පිළි නොපදින ඕනෑම කෙනෙකුට, චන්දිකා කියා කියයි. දුක් වේදනා ගෙන දෙන එවන් චන්දිකාවන්ගේ මේලාවක්ද තිබේ. මනුෂ්‍යයින් අඥානයි. ඔවුන්ට මෙහි අරුත වැටහෙන්නේ නැත. කිසිම කෙනෙකුට කිසි ශක්තියක් නැත ඔවුන්ගේ ඇතුලාන්තය, සම්පූර්ණයෙන්ම හිස්ය. ඔබ ඉතා හොඳින් පරම පියාව සිහිපත් කරන විට, ඔබට පරම පියාගෙන් ශක්තිය ලැබෙනවා. කෙසේවෙතත්, මෙහි ජීවත් වන අතරත්, ඔබගෙන් බොහෝ දෙනෙකුගේ බුද්ධි පිටත සැරිසරයි. මේ නිසයි බාබා පවසන්නේ පිංතූර ඉදිරියේ අසුන්ගන්න, එවිට ඔබගේ බුද්ධිය ඒවායේ නියැලී තිබෙයි. ඔබ වෙනත් අයට, චක්‍රයේ සහ ඉනිමගෙහි පිංතූර විස්තර කරන විට, ඔවුන්ට කියන්න ස්වර්ණමය යුගයේ සිටින්නේ මනුෂ්‍යයින් ඉතා සුළු පිරිසකි. දැන් බොහෝ මනුෂ්‍යයින් සිටිති. පරම පියා පවසන්නේ මා බ්‍රහ්මා මඟින් නව ලෝකයේ ස්ථාපනයද, පැරණි ලෝකයේ විනාශයද දිරිමත් කරවනවා. අසුන්ගෙන මේ අන්දමින් පුහුණු වන්න. ඔබගේ මුව ඉබේටම විවර වෙයි. ඇතුලාන්තයේ සිදුවන කුමක් වුවත්, එය නිසැකයෙන්ම පිටතට පැමිණිය යුතුයි. ඔබ ගොළු නැත. නිවසේ සිටින විට කෑ ගැසීමට ඔබගේ මුව විවර වෙන නමුත්, ඔබට ඥානය පැවසීමට තවම එය විවර කළ නොහැක! මෙම පිංතූර සෑම කෙනෙකුටම ලබා දිය හැක. ඔබගේ නිවෙස් වල අයට සෙත සැලසීමට ඔබ එඩිතර විය යුතුයි. පිංතූර වලින් ඔබගේ කාමරය සරසන්න, එවිට ඔබ කාර්ය බහුලව රැඳී සිටිනු ඇත. එය ඔබගේ පුස්තකාලය මෙන් වෙයි. අන් අයට යහපතක් සිදුකිරීම සඳහා ඔබ මෙම පිංතූර එල්ලිය යුතුයි. පැමිණෙන ඕනෑම කෙනෙකුට විස්තර කරන්න, එවිට ඔබට බොහෝ සේවය කළ හැක. ඔවුන් ඥානය ටිකකට සවන් දුන්නත්, ඔවුන්ට පුරවැසියන් විය හැක. දියුණු වන්නට බාබා ඔබට බොහෝ ක්‍රමවේද පෙන්වා දෙයි. පරම පියාව සිහිකරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වනු ඇත. එසේ නොමැති නම්, ඔබ ගංගා නදියේ නැවත

ඔබගේ පාපයන් දුරු කරගත නොහැක. ඒ සියල්ල අන්ධ විශ්වාසයි. හරිද්වාර් වලදී වුවද, මුළු නගරයේම සියලුම කුණු කසල වැටෙන්නේ ගංගා නදියටයි. බොහෝ කුණු කන්දල් මහ මුහුදට ගසාගෙන යයි. ගංගා වලද බොහෝ කුණු කසල තිබේ. කෙනෙක් ඉන් පිවිතුරු වන්නේ කෙසේද? මායා, සෑම කෙනෙක්වම සම්පූර්ණයෙන්ම අඥානයින් බවට පත් කර තිබේ. පරම පියා ඔය දරුවන්ට පවසන්නේ මා සිහි කරන්න. ඔය ජීවාත්මයන්ද අඬගැසුවේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, එන්න! ඔබට ඔබගේ ශරීරයන්ගේ භෞතික පියවරුන් සිටියි. පාරිශුද්ධකරු වන්නේ පරම පියා පමණයි. ඔබ දැන් ඔබව පිවිතුරු කරවන පරම පියාව සිහි කළ යුතුයි. ජීවන-මුක්තිය පිරිනමන්නේ වෙනත් කිසිවෙක් නොව, ඒකායන ඔහු පමණකි. මෙතරම් පහසු දේ වල අරුත, කිසිම කෙනෙකුට වැටහෙන්නේ නැත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ මුවින් ඥානයේ මිණි මුතු පමණක් මතුවීමට ඉඩ දීමට පුහුණු වන්න. කිසිම විටෙක කටු හෝ ගල් ඉන් මතු වන්නට ඉඩ නොදෙන්න. තමන්ට සහ අන් අයට සෙත සැලසීම පිණිස, ඔබගේ නිවස, පිංතූර වලින් සරසන්න. ඥානයේ මහා සයුර කලඹා, අන් අයට විස්තර කිරීමට පිංතූර භාවිත කරන්න. මෙය කිරීමේ කාර්ය බහුල වන්න.
2. පරම පියාගෙන් ආශිර්වාද ඉල්ලීම වෙනුවට, ඔහුගේ උසස් උපදෙස් පිළිපදින්න. ශ්‍රේෂ්ඨත්වය, ශිව බාබාගේය! එබැවින් ඔහු පමණක් සිහි කරන්න. බාබාට මෙතරම් දීම ගැන අහංකාර නොවන්න.

**වරදානය:** පියාට සමාන වීමේ මනෝ ස්ථිතිය තුළින්, කාලය ඔබේ සමීපයට ගෙන ඒමෙන් "ඔබටත් එයම අදාළ වේ" යන ආශිර්වාදය ඔබට හිමි වේවා.

**පාඨය:** එකිනෙකාගේ අදහස්වලට ගරු කරන්න, එවිට ඔබේ වාර්තාව හොඳ වනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබේ මනසින් සේවය කිරීමට නම්, ඔබේ මනස සහ බුද්ධිය නිෂ්ඵල සිතිවිලි වලින් නිදහස් විය යුතුය. එහිදී මන්මනාභව් මන්ත්‍රයේ පහසු ස්වරූපය තිබිය යුතුය. බලවත් සිතිවිලි, සුබ පැතුම් සහ පිරිසිදු හැඟීම් ඇති උසස් ජීවාත්මයන්ට තම මනසින් බල පරිත්‍යාග කළ හැකිය.